**බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය අනුග්‍රහයෙන් වූ ප්‍රාදේශීය පාලම් II ව්‍යාපෘතිය (එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය) 2013**

---

බ්‍රිතාන්‍ය රජයේ මූල්‍ය අනුග්‍රහයෙන් වූ ප්‍රාදේශීය පාලම් ව්‍යාපෘතියේ (එක්සත් රාජධානි වානේ පාලම් ව්‍යාපෘතිය) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යාවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ජාතික මහාමාර්ගවල වානේ පාලම් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී ලං ර) හා සීමාසහිත හොන්ග්කොන්ග් ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් පබ්ලික් ලිමිටඩ් සමාගම (එච් එස් බී සී) අතර 2013 ජුනි 21 දින එළඹී අංක 53 එම්/එෆ්සී/1448 (201327/එස්එල්) දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, මහාමාර්ග හා නාවික අමාත්‍යාංශය (ව.ම.නා.අ) වර්තමානයේ මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය සහ මාර්ග සංවර්ධන අධිකාරිය (මා.සං.අ) පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ පහත සඳහන් කරුණු මඟින් මාර්ග යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීමයි.

(අ) ග්‍රාමීය පාලම් 104 ක් සැලසුම් කිරීම,මැනීම හා සැපයීම.

(ආ) දේශීය සේවා සහ දේශීය ද්‍රව්‍ය සඳහා දායකත්වය.

(ඇ) වර්ෂ 4 කට වැඩි කාලයක් සඳහා එක්සත් රාජධානි තාක්ෂණික සහාය හා පුහුණුව ලබා දීම.

අනතුරුව, අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව විසින් ග්‍රාමීය පාලම් 104 වෙනුවට පාලම් 96 ආදේශ කරන ලදී. ණය ගිවිසුම අනුව, පාලම් සැපයීම හා සවිකිරීම සඳහා කොන්ත්‍රාත්තුව රු.මිලියන 9,778.05 කට සමාන ස්ටර්ලින් පවුම් මිලියන 45 ක පිරිවැයකට එක්සත් රාජධානියේ කොන්ත්‍රාත්කරුවකුට සම්පූර්ණ මුදලම එකවර ගෙවීම පදනම මත 2012 අප්‍රේල් 26 දින ප්‍රදානය කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 සැප්තැම්බර් 19 දින ආරම්භ කරන ලද අතර 2017 සැප්තැම්බර් 18 වනවිට වර්ෂ 4 ක් ඇතුළත නිමකිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

-----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේදි කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා සාධාරණ පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්,වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනා ගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව සහ

(උ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 3. මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

------------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

---------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් පළමු ගිණුම් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.මිලියන 4,018 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| **විස්තරය** | **2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** |
|---|---|
| | රු. |
| ස්ථාවර වත්කම් | 416,827 |
| පාලම් | 441,324,586 |
| තාක්ෂණික සහාය | 15,998,688 |
| ව්‍යාපෘති කළමනාකරණය | 16,596,689 |
| ජංගම වත්කම් | 3,543,955,687 |
| | 4,018,292,477 |

## 5. විගණන නිරීක්ෂණ

කොන්ත්‍රාත් ගිවිසුම අනුව,පාලම් අධිව්‍යුහයන් සැලසුම් කිරීම සඳහා වැඩබිම පරිමාණයන් හා භූ තාක්ෂණ සමීක්ෂණ සිදුකිරීම සඳහා කොන්ත්‍රාත්කරු වගකිව යුතුය.කෙසේ වුවද මාර්ග සංවර්ධන අධිකාරිය පාලම් 50 ක් සඳහා විස්තරාත්මක සැලසුම් කිරීම් සිදුකර තිබූ අතර ඒ සඳහා දරන ලද පිරිවැය තීරණය කර ගිණුම් ගත කර නොතිබුණි. තවද, බෝර් හෝල් (Bore Hole) විමර්ශන සඳහා ව්‍යාපෘතිය විසින් දරන ලද රු.1,037,865 ක මුදලක්, කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව ව්‍යාපෘතියේ පිරිවැය ලෙස සලකා තිබුණි.

## 6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 6.1 අරමුදල් උපයෝජනය

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකි වූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය, ව්‍යාපෘතියේ අයවැයගත ප්‍රතිපාදන හා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට තත්ත්වය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන | 2013 වර්ෂය සඳහා අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල් |
|---|---|---|---|---|---|
| | එක්සත් රාජධානි ස්ටර්ලින් පවුම් මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| එච් එස් බී සී | 45.0 | 9,778.05 | 1,500 | 3,533.06 | 3,533.06 |
| ශ්‍රී ලං ර | - | 2,500.00 | 200 | 118.19 | 118.19 |
| එකතුව | 45.0 | 12,778.05 | 1,700 | *3,651.25 | 3651.25 |

* වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල ඇතුළත් කර නොතිබූ හෙයින් මෙම මුදල් 4 ඡේදයේ දැක්වෙන මුදල සමඟ එකඟ නොවේ.

6.2 භෞතික කාර්ය සාධනය

----------------------------

ව්‍යාපෘතියේ කාර්යසාධනය කාලීන වශයෙන් ඇගයීම් කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් විස්තරාත්මක ව්‍යාපෘති සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. තවද පාලම් සැපයුම්කරුගේ එකඟතාවය සහ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව අවස්ථා දෙකකදී කොන්ත්‍රාත්තුවේ ආරම්භක වැඩ විෂය පථය පසුව වෙනස් කර තිබුණි. එබැවින්, දික් අඩි 3,077.9 ක දිගින් යුත් වෙනස් කළ හැකි පාලම් 104ක් දික් අඩි 2,999.5 ක දිගින් යුත් පාලම් 96 ක් දක්වා අඩුකර තිබුණි. කොන්ත්‍රාත්තුවේ ආරම්භක වැඩ විෂය පථයේ එවැනි නිරන්තර වෙනස් කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස, නියමිත පිහිටීම, දිග,පළල හා පාලම ඉදිකිරීමේ ප්‍රමුඛතා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට හඳුනාගැනීමට නොහැකි වී තිබුණු අතර ඒ සඳහා ආරම්භක සැලසුම් වෙනස් කර තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය පහත දැක්වෙන වගුවේ විස්තර කෙරේ.

| **පාලම් වර්ගය** | **ඉදිකිරීම් සඳහා යෝජනා කරන ලද පාලම් සංඛ්‍යාව** | **2013 දෙසැම්බර් 31 දිනට ආරම්භ කරන ලද පාලම් වැඩ සංඛ්‍යාව** |
|---|---|---|
| | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| වෙනස් කළ හැකි පාලම් (සී 200) | 39 | 5 |
| සම්පිඩිත කඩිනම් පාලම් | 33 | 1 |
| ඩෙල්ටා පාලම් | 02 | - |
| ඇට්ලස් පාලම් | 21 | 5 |
| සංගෘහිත (Composite) පාලම් | 01 | 1 |
| එකතුව | 96 | 12 |